*සැ. යු.*- 2021.01.08 දින අංක 2,210 දරන *ගැසට් පත්‍රයේ* I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,211 - 2021 ජනවාරි මස 15 වැනි සිකුරාදා - 2021.01.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 2 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 පෙබරවාරි මස 05 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජනවාරි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

ගල්කිස්ස දිසා අධිකරණයේ දී ය

සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී,
*පෙර*
දෙවන මහල, අංක 33,
උද්‍යාන පාර, කොළඹ 02,
සහ දැනට
අංක 13, ද ෆොන්සේකා පෙදෙස, කොළඹ 04.

නඩු අංකය : DDR/729/2017
(කොළඹ දිසා අධිකරණ)
ඇස්කිසි අංකය : 8/2020
(ගල්කිස්ස දිසා අධිකරණ)

*..........................පැමිණිලිකරු.*

*එදිරිව*

01. කන්නියප්පන් විශ්වලිංගම්
02. ජයසිංගම් සුභාශිනී
03. ගජේන්ද්‍රරාජ් විශ්වලිංගම්
04. ඉන්ද්‍රානි විශ්වලිංගම්

*සියලුදෙනාම*

අංක 21, ඉන්ද්‍රා මාවත,
කළුබෝවිල,
දෙහිවල.

*...........................විත්තිකරුවෝ.*

වර්ෂ 2019ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින නියත කරන ලද කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ නෛසයි තීන්දු ප්‍රකාශයට අනුව එනම් 2017.06.22 වැනි දිනට ශ්‍රී ලංකා මුදලින් දෙසිය පනස් ලක්ෂ අසූ දහස් හයසිය හැත්තෑ හයක් සහ ශත විසි අටක (රු. 25,080,676.28) මුදලක් හා එකී මුදලින් ප්‍රාග්ධන ණය මුදල ලෙස අයවිය යුතුය. (රු. 16,842,204.27) මුදලක් මත 2017.06.23 දින සිට තීන්දු ප්‍රකාශිත දිනය දක්වා වර්ෂයකට 14% බැගින් බලාත්මක පොලී ප්‍රතිශතයක් මත ගණනය කළ පොලිය ද, තීන්දු ප්‍රකාශිත දින සිට තීන්දු ප්‍රකාශිත සම්පූර්ණ මුදල මත අදාළ නෛතික පොලිය ද, එම මුදල අයකර ගැනීම සඳහා 1994 අංක 09 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව විත්තිකරුවන්ට විරුද්ධව ඇතුළත් කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශය අනුව නඩු ගාස්තු ද, ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට ද, එකී මුදල් විත්තිකරුවන්ගේ ගෙවල්, ඉඩම්, ණය සහ අයවිය යුතු ණය තහනමට ගැනීමෙන් සහ අවශ්‍ය වුවහොත් විකිණීමෙන් පැමිණිලිකරුවන් හට මුදල් අයකර දීම සඳහා මා වෙත නිකුත් කර ඇති ඇස්කිසි බලපත්‍රය ප්‍රකාරව, මෙම නඩුවේ පළමුවන විත්තිකරු සතු මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපල වර්ෂ 2020ක් වූ මාර්තු 11 වැනි දින ගල්කිස්ස දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් මෙයින් තහනමට ගනු ලැබේ.

මෙසේ තහනමට ගන්නා ලද නිශ්චල දේපල විකිණීම, අන්සතු කිරීම, ණය බරකට හිලව් කිරීම, උකස් කිරීම, පැවරීම, බදු දීම හෝ කුමන හෝ ආකාරයකින් අන්සතු කිරීම මෙම නඩුවේ විත්තිකරුවන් වන ඔබට මෙයින් තහනම් කරමි. තව ද, මෙකී තහනම් කරන දේපල කුමන හෝ ආකාරයකින් සතුකර ගැනීම, මිලට ගැනීම, ණය බරකට යටත්කර ගැනීම, හිලව් කිරීම, උකස් ගැනීම, බදු ගැනීම, අන් කවර හෝ කෙනෙකුට ද මෙයින් තහනම් කරනු සහ වලක්වනු ලැබේ.

එකී තහනමට ගන්නා ලද දේපල සම්බන්ධයෙන් විත්තිකරුවන් කිසිදු පියවරක් ගෙන නොමැති බැවින්, එකී දේපළ විකුණා පැමිණිලිකාර ආයතනයට මුදල් අයකර දීම සඳහා මෙහි පහත උපලේඛනය සඳහන් දේපල පිහිටි ස්ථානයේ දී

**වර්ෂ 2021 ක් වූ ජනවාරි මස 22 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

*දේපලට පිවිසීම.-* හැව්ලොක්ටවුන් දෙසට හැව්ලොක් පාරේ කිලෝමීටර් 2ක් පමණ යන විට පාමංකඩ පාලම අසලින් දුටුගැමුණු මාවතේ මීටර 600ක් ගිය තැන හමුවන ඉන්ද්‍රා මාවතෙන් මීටර 300ක් ගිය තැන දකුණු අත පැත්තට වන්නට මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-*

01. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට 25% දේපළ මිලදී ගත් වහාම ගෙවිය යුතු අතර ඉතිරි 75%ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

02. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැනුම්කරු විසින් ගැනුම් මිලෙන් පළමු රු. 7,500/- සඳහා රු. 150/- ක ගාස්තුවක් ද, රු. 7,500/- ඉක්මවන සෑම රු. 1,000/-ක් සඳහාම රු. 05/- බැගින් ද, පිස්කල් ගාස්තු හා විකුණුම් සඳහා වන සියලු වියදම් ද ගෙවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය ගල්කිස්ස.

2020 ක් වූ දෙසැම්බර් මස 03 වැනි දින.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස නාගරික බලසීමාවේ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 238, කළුබෝවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මාරගහවත්ත, කහටගහවත්ත, බඳුල්ලගහවත්ත සහ කොහිලවලලන්ද නමැති ඉඩමට බලයලත් මිනුම්කරු වන ඒ. පී. එස්. ගුණවර්ධන විසින් 1976.04.23 වැනි දින මැන සකස් කරන ලද අංක 797 දරන පිඹුරේ ලොට් අංක 08 දරන බිම් කොටසට *හෙවත්* වරිපනම් අංක 21, ඉන්ද්‍රා මාවත, කළුබෝවිල යන බිම් කොටසට මායිම්ව,

උතුරට : ලොට් අංක 1 ද,
නැගෙනහිරට : 673 දරන පිඹුරේ ලොට් A ද,
දකුණට : ලොට් 09,
බස්නාහිරට : ලොට් 07 තුළ පිහිටි පර්. 07.52ක් විශාල ඉඩම,

යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් 07.52ක් විශාල ඉඩම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 160/32 දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය, ගල්කිස්ස.

2020ක් වූ දෙසැම්බර් මස 03 වැනි දින.

01-517

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.